(6)

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග 2015 පුනර් පරීක්ෂණය - 2019 දෙසැම්බර්/2020 ජනවාරි
Bachelor of Arts General (External) Degree Part II Repeat Examination 2015 – Dec. 2019/Janu. 2020

# භූවිසා 3.2 - ප්‍රාදේශීය භූගෝල විද්‍යාව
# GYG 3.2 - Regional Geography

කාලය පැය තුන යි

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ. යටත් පිරිසෙන් එක් කොටසකින් ප්‍රශ්න දෙක (02) බැගින්වත් තෝරා ගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න

## I කොටස

01. ප්‍රාදේශීය භූගෝල විද්‍යාව යනු කුමක්දැයි නිර්වචනය කර එහි සංවර්ධනය සහ විකාශනය සිදු වූ ආකාරය නිශ්චිත නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

02. "සංචාරක කර්මාන්තය ශ්‍රී ලංකාවට විදේශ විනිමය ලබාදෙන ප්‍රධාන මූලාශ්‍රයක් වුව ද එමගින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට තවමත් නොහැකි වී ඇත."
සංචාරක කර්මාන්තය මුහුණ දෙන අභියෝග පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් ඉහත සඳහන් ප්‍රකාශය විවේචනාත්මකව විග්‍රහ කරන්න.

(ලකුණු 20)

03. i. සංස්කෘතික ගෝලීයකරණය යනු කුමක් ද?

(ලකුණු 06)

ii. ප්‍රාදේශීය සංස්කෘතික අනන්‍යතාවන්ට ගෝලීයකරණය බලපෑම් කරන ආකාරය ශ්‍රී ලංකාව ඇසුරින් නිශ්චිත නිදසුන් සපයමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 14)

04. "ශ්‍රී ලංකාවේ වනාන්තර සිසුවෙන් විනාශ වෙමින් පවතින බවත්, සාගරික කොරල් පරවලින් බහුතරය හායනය වී තිබෙන බවත් පර්යේෂණවලින් අනාවරණය වී ඇත."
මෙම ප්‍රකාශය පිළිබඳව අවධානය යොමු කරමින් ස්වාභාවික සම්පත් සංරක්ෂණය අරමුණු කරගත් ප්‍රාදේශීය සංවර්ධන සැලසුම්කරණයේ ඇති විභවතාව පිළිබඳ සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

## II කොටස

05. i. පසුගිය තෙවසරක කාලය තුළ ශ්‍රී ලංකාවේ දැඩි ලෙස නියඟය බල පැවැත්වූ ප්‍රදේශ හතරක් නම් කරන්න.

(ලකුණු 04)

ii. එමගින් ඇති වූ ප්‍රධාන ප්‍රතිවිපාක 2 ක් නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

iii. නියඟය නිසා ඇතිවන ප්‍රතිවිපාක අවම කිරීමට ප්‍රාදේශිකව ගත හැකි ක්‍රියාමාර්ග මොනවාදැයි දක්වන්න.

(ලකුණු 08)

06. පහත සඳහන් මාතෘකා පිළිබඳව අවධානය යොමු කරමින් මානව සංවර්ධන දර්ශකය (Human Development Index) පිළිබඳව පැහැදිලි කරන්න.

i. නිර්ණායක සහ ගණනය කරන අයුරු

(ලකුණු 10)

ii. රටවල් කාණ්ඩ කිරීම

(ලකුණු 05)

iii. ශ්‍රී ලංකාවට හිමිවන ස්ථානය

(ලකුණු 05)

07. i. ශ්‍රී ලංකාවේ පලාත් පාලන ආයතන (Local Authorities) වර්ග කර ඇති ආකාරය ලුහුඩින් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ii. පලාත් පාලන ආයතන ප්‍රදේශයේ පොදු මහජනතාවගේ සුභ සාධනයට ඇති කරන බලපෑම උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 14)

08. i. යෝජිත ජාතික භෞතික සැලැස්ම (National physical structure plan 2030) යනු කුමක්දැයි හඳුන්වන්න.

(ලකුණු 05)

ii. ජාතික භෞතික සැලැස්මෙහි (2030) මූලික ලක්ෂණ හෝ ක්‍රියාමාර්ග තුනක් පැහැදිලි කරන්න.

(ලකුණු 5x3 = 15)

******************************